**එන්. එම්. ලක්මිණී රාධිකා**
සහකාර අධ්‍යක්ෂ
පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය, මධ්‍යම පරිසර අධිකාරිය

# තෙත් බිම් ජෛව විවිධත්වයේ අසිරිය

බත්කූරෙක් කෙකටිය දණ්ඩක වැනෙමින් සිටිනා
සමනළයෙක් මල් ගොමුවක වටපිට කරකැවෙනා
රූටන්නෙක් දිය මත ඔබමොබ රූටන් දුවනා
කබරගොයෙක් බඩගා හෙමිහිට දිය වෙත ඇදෙනා

දියසෑනෙක් පෙඳය වනා නෙක හැඩ වැඩ දමනා
දියකාවෙක් එකවර දිය යට කිමිදී ගිලෙනා
කොරවක්කෙක් කඩිමුඩියේ පඳුරක් වෙත ඇදෙනා
පිළිහුඩුවෙක් කුඩා මසුන් වෙත නෙතු යොමු කරනා

පැස්තුඩුවෙක් තටු ගසමින් ඉගිල්ලෙන්නට සදනා
බිඟුහරයෙක් ඒ අසළින් ගී ගයමින් සරනා
කොළ වඳුරෙක් එල බුදිමින් මේ අසිරිය දකිනා
නිමේශයක් නැවතී බලනුව අසිරිය තුටිනා

ප්‍රවේණියක් සඟවාගත් විශේෂයන් සිටිනා
විශේෂයක් විශේෂයන් සමඟ නිබඳ වෙසෙනා
තෝතැන්නක් විවිධ සතුන්හට නිවහන සදනා
පරිසරයක් තෙත් බිම් විවිධත්වය හැඩ කරනා



22.05.2021 ලෝක ජෛව විවිධත්ව දිනය වෙනුවෙනි